**ශීර්ෂය 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

----------------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ2018දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවටඅදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018දෙසැම්බර් 31 දිනට හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළමතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේඅභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂ සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැක. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දී වෙනත් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් රැස් කළ රු.9,562,994 ක් භාණ්ඩාගාරයෙන් ලද අත් මුදල් ලෙස සටහන් කිරීම වෙනුවට බදු නොවන ආදායම් හා වෙනත් ලැබීම් ලෙස සටහන් කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(ii) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් ආදායම් එකතුකරනු ලබන අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු පමණක් ACA 1 යටතේ ඇතුළත් නොකළ යුතු බවටත්, අදාල දෙපාර්තමේන්තු ආදායම් ACA 1 යටතේ ඇතුළත් කළ යුතු බවටත් සඳහන් කර තිබීමට අනුව සටහන් කර ඇත. |

### 1.6.2 දේපළ පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.54,857,503ක් වුවද,සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂය රු.6,086,907 ක් වූයෙන් රු.48,770,596 ක වෙනසක් විය. | අනුරූපී සංඛ්‍යා නිවැරදිව හෙළිදරව් කළ යුතු වීම. | 2017 වර්ෂයේ දී අවුරුදු 15 කට වැඩි කාලයක් තිස්සේ මිලදී ගනු ලැබූ දේපළ එකතුවේ වටිනාකම රු.54,857,503ක් ලෙස සඳහන් කර ඇත. 2018 වර්ෂයේ සිට නියමිත පරිදි ආයතනයේ දේපළවල සත්‍ය වටිනාකම ගණනය කරමින් මූල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් කර ඇත. |
| (ආ) ගෘහ භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂවලදී අරනෙරි පාසල්වලට ප්‍රදාන වශයෙන් ලබා දී තිබූ රු.2,970,000 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි මූල්‍ය | ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා ප්‍රදාන වශයෙන් ලබාදුන් මුදල් දෙපාර්තමේන්තුවේ වත්කම් ලෙස ගණන් නොගත යුතු වීම. | එකඟ වී ඇත. |

| | | |
|---|---|---|
| නොවන වත්කම් මිලදී ගැනීම් ලෙස දක්වා තිබුණි. | | |
| (ඇ) දෙපාර්තමේන්තුවට අයත් විවිධ ප්‍රදේශවල පවතින ඉඩම් හා ගොඩනැගිලි 4ක වටිනාකම් තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු සියලුම මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කළ යුතුය. | ගොඩනැගිලි 02 ක වටිනාකමගණනයකර 2019 වර්ෂයේ දී මූල්‍යප්‍රකාශනවල සඳහන් කර ඇත. ඉතිරි ගොඩනැගිලි 02 හි වටිනාකම ගණනය කර ගිණුම්ගත කිරීමට අවශ්‍යකටයුතු සිදු කරමින් පවතී. |

**1.6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**----------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) ස්ථාන මාරු වී ගිය නිළධාරීන් 03දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.46,462 ක් වූ ණය ශේෂ වර්ෂ 27 කට අධික කාලයක සිට පැවත එන අතර එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | ලබා දුන් ණය මුදලෙන් රු.86,931ක ශේෂය අයකර ගැනීමේ දී ගැටළු සහගත තත්වයක් පැන නැගී ඇති බැවින් එම ණය ශේෂය මහාභාණ්ඩාගාරය වෙත යොමු කර ඇත. |
| (ආ) සේවය හැර ගිය සේවකයන් 03දෙනෙකුගෙන් අය විය යුතු වර්ෂ 1ක සිට වර්ෂ 24ක කාල පරාසයක සිට පැවත එන රු. 66,269 ක් වූ ණය මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | සංවර්ධන නිලධාරීනියකගෙන් අයකර ගත යුතු වන රු.25,800/- ක ණය ශේෂය මෙම මාසය ඇතුළත දී ගෙවීමට එකඟ වී ඇත. |

**1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමු** | **අනුකූල නොවීම** | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 237 | ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේ දී භාණ්ඩ ලැබී ඇති බවට හා අදාල බඩු ලේඛනයෙහි, තොග පොත යනාදියෙහි එකී භාණ්ඩ ඇතුළත් කර ඇති බවට තහවුරු කර ගත යුතුයි. එසේ වුවද, දෙපාර්තමේන්තුව විසින් අරනෙරි පාසල් ළමුන් හා ගුරුවරුන් සඳහා නිල ඇඳුම් රෙදි මිල දී ගැනීමේ දී සහ හින්දු ජනතාව සඳහා ආගමික පොත් හා අරනෙරි පාසැල් ළමුන් සඳහා උපකාරක පොත් මුද්‍රණය කිරීමේදී අදාළ භාණ්ඩ දෙපාර්මේන්තුව වෙත ලැබීමට ප්‍රථම රු.14,137,473 ක් ගෙවීම් කර තිබුණි. | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ගෙවීම් සඳහා ලේඛන සකස් කර ඇතත් එම ගෙවීමඅදාල පුද්ගලයින්ට නිකුත් කර නොමැත. |
| (ii) මුදල් රෙගුලාසි 264 | සෑම ගෙවීමක් සඳහාම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබාගත් කුවිතාන්සියකින් තහවුරුකර ගත යුතු වුවත්, එකතුව රු.55,007,000 ක් වු ගෙවීම් 149 ක් සඳහා ආදායකයන්ගෙන් කුවිතාන්සි ලබාගෙන නොතිබුණි. | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදාල කුවිතාන්සිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.7. ඡේදය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර එම වාර්තා පසුව එළඹෙන වර්ෂයේ මාර්තු 31 දිනට පෙර ඉදිරිපත් කල යුතුයි. එසේ වුවද, 2017 හා 2018 වර්ෂවලට අදාලව පුස්තකාල පොත් සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2019 අප්‍රේල් 30 දින වන විටත් ලබා දී නොතිබුණි. | සියලුම භාණ්ඩ සඳහා වාර්ෂික සමීක්ෂණය සිදුකළ යුතු වීම. | පුස්තකාලය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ 2017 හා 2018 වර්ෂය සඳහා මුළුමනින්ම නිමා කර නොමැත. |
| (ඇ) 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වර්ෂ 5ක් එකම සේවා ස්ථානයෙහි සේවා කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත්, වර්ෂ 5 ක සිට වර්ෂ 24 ක් දක්වා කාල පරාසයක් තුළ සේවය කරනු ලබන නිලධාරීන් 85 ක් සඳහා එවැනි ස්ථාන මාරුවීම් ලබා දී නොතිබුණි. | චක්‍රලේඛයප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිලධාරින් සඳහා ස්ථාන මාරුවීම සම්බන්ධයෙන් අදාල පරිපාටිය අනුව වාර්ෂිකව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කර ඇත. අභ්‍යන්තර මාරුවීම සම්බන්ධයෙන් අදාල කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. |
| (ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>(i) 4.3.1 මාර්ගෝපදේශය | ප්‍රසම්පාදනයන් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් හින්දු කෝවිල් 21 ක සංවර්ධන කටයුතු වෙනුවෙන් රු.6,000,000 ක් ලබා දීමේදී මුළු පිරිවැය ඇස්තමේන්තු ලබාගැනීමෙන් තොරව ගෙවීම් සිදු කර තිබුණි. | මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදාල පිරිවැය ඇස්තමේන්තුවේ පිටපතක් ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. |
| (ii) 8.12.2 මාර්ගෝපදේශය | පිරිවිතර සහ එකඟ වී ඇති වෙනත් නියම සහ කොන්දේසිවලට අනුකූලව වැඩ ඉටුකර ඇති බවටත් සහතික කර ඇති ගෙවීම්, කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවලට අනුකූල බවටත් තහවුරු කරමින් සහතිකයක් ලබා ගත යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් හින්දු කෝවිල් 26 ක සංවර්ධන කටයුතු වෙනුවෙන් ලබාදුන් එකතුව රු.7,800,000 ක් සම්බන්ධයෙන් | වැඩ නිම කිරීමේ සහතික ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | වැඩ නිම කිරීමේ සහතිකය අදාල ලේඛනය සමග ඉදිරිපත් කරන ලෙසසියලුම ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට ලිඛිතව දැනුම් දී ඇත. |

වැඩ නිමකිරීමේ සහතික ලබා ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පුනරාවර්තන වැය විෂයයන් 9ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 2ක් සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 8 ක සිට සියයට 50 ක් දක්වා පරාසයක ඉතිරිවීම්වල එකතුව රු.20,557,010ක් විය. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම්, බිල්පත් නොලැබීම, නාස්තිය අවම වීම, අවශ්‍යතා ඇතිනොවීම, අක්මුදල් නොලැබීම වැනි කරුණු හේතුවෙන් ඉතිරිවීම් සිදු විය. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2019 වර්ෂයේදී වැය විෂයයන් 2කට අදාළව 2018 වර්ෂයේ එළඹි බැරකම් වෙනුවෙන් රු.162,366ක් ගෙවා තිබුණ ද, එම බැරකම් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් යටතේ හෙළිදරව් කර නොතිබුණි. | වර්ෂයට අදාළ බැරකම් හා බැඳීම් නිවැරදිව හඳුනාගෙන වාර්තා කළ යුතු වීම. | වැරදීමකින් බැරකම් ප්‍රකාශනයේ සඳහන් කර නොමැති නමුත් මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාව දක්වා ගමන් වියදම් ලෙස 36,610ක් සඳහන් කර ඇත. |
| (ආ) අතිකාල දීමනා ඉතිරිවීම් රු.1,234 ක් වුවද, ඉතිරිවීම් ඉක්මවා රු.118,912ක් 2019 වර්ෂයේ දී වැයකර තිබුණි. | ඉතිරිවීම් ඉක්මවා බැරකම් පියවීමට කටයුතු නොකළ යුතුය. | 2018 වර්ෂයේ දී ගෙවන ලද 2017 වර්ෂයට අදාළ බැරකම රු.136,622 ක් වන බැවින් 2018 වර්ෂයේ ඉතිරිය රු.17,710 කි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) හින්දු ආගමික පොත් හා අරනෙරි පාසල් ළමුන් සඳහා උපකාරක පොත් මුද්‍රණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනරු.991,143 ක් වැයකර තිබූ අතර, ඉන් 2019 ජුනි 18 දින වන විටත් රු.380,413ක් වටිනා පොත් අරමුදල වෙත ලැබී නොතිබුණි. | අපේක්ෂිත අරමුණු කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු මනාව සැලසුම් කළ යුතු වීම. | පසුගිය වර්ෂයේ දී අක්මුදල් ලබා ගැනීමේ දී ඇති වූ ප්‍රමාදයන් හා පැවති තත්ත්වයන් හේතුවෙන් පොත් මුද්‍රණය කිරීම සඳහා වූ නියෝගය ලබාදීමේදී ප්‍රමාද ඇතිවිය. මේ වන විට එම පොත් මුද්‍රණ කටයුතු අවසන් කර ඇත. ඉදිරි සතිවල එම පොත් දෙපාර්තමේන්තුවට ලබා ගැනීමට හැකිවේ. මෙවැනි තත්ත්වයන් ඉදිරියේදී ඇති නොවීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. |
| (ආ) අරනෙරි පාසල්ගුරුවරුන් සඳහා නිල ඇඳුම් රෙදිමිලදී ගැනීම් කටයුතු සමාලෝචිත වර්ෂයේ දී සිදුකිරීමට සැලැසුම් කළද, සාරි 1,000 ක් මිලදී ගැනීම සඳහා රු.1,150,000 ක් ගෙවීම් කර තිබුණේ දෙසැම්බර් මාසයේදීය. එසේ වුවද, 2019 මැයි 30 දින වනවිටත් ලැබී තිබුණේ සාරි 400 ක් පමණි. මිලදී ගැනීමේ කටයුතු වර්ෂය අවසානයේ දී ආරම්භ කිරීම හේතුවෙන් 2019 මැයි වනවිටත් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි. | අපේක්ෂිත අරමුණු කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු මනාව සැලසුම් කළ යුතු වීම. | නිල ඇඳුම් රෙදි මිලදී ගැනීමේ දී අසාමාන්‍ය ප්‍රමාදයන් සිදු වී ඇත. දැනට ලබා දී ඇති නිල ඇඳුම් බෙදාහැරීමේ කටයුතු සිදු කරඇත.මෙවැනි තත්තවයන් වැළැක්වීම සඳහා ඉරිදියේදී පියවර ගනු ඇත. |

**3.2 වාර්ෂික කාර්ය සාධන වාර්තාව**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2017 හා 2018 වසර සඳහා වූ කාර්ය සාධන වාර්තාවදැනට සකස් කර |

| | | |
|---|---|---|
| ඇතුළත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2019 අප්‍රේල් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | | ඇත. එම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කඩිනමින් කටයුතු කරන බව දන්වා සිටිමි. |

**3.3** **පාඩු හා හානි**

-------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2008 වර්ෂයේ සිදුකළ භාණ්ඩ සමීක්ෂණය මඟින් හඳුනාගෙන තිබූ වටිනාකම නිශ්චය කිරීමට නොහැකි වූ නැති වූ පුස්තකාල පොත් 350ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 101 හා 102 පරිදි පරීක්ෂණ සිදුකර පාඩුව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් ලේඛනගත කර නඩත්තු කිරීම් හා ඉවත් කිරීමේ කටයුතු මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පොත් රජයේ මුදල් උපයෝගී කරගෙන මුද්‍රණය කර නොමැත. ඒ අනුව මීට අදාළව මුදල් රෙගුලාසි 101 හා 102 පරිදි පරීක්ෂණ සිදු කර නොමැත. ඊට අදාළ උපදෙස් ලබා ගෙන කටයුතු කරනු ලැබේ. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

---------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| "තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය'' ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් අදාලවන තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක, එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද හා ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධනය න්‍යාය පත්‍රයප්‍රකාරවකටයුතු කළ යුතු වීම. | 2030 දී තිරසර සංවර්ධනය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරන ලද ලඟා කර ගත යුතු ඉලක්ක 17 දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන් සමඟ ඍජුව සම්බන්ධවී නොමැත. |